**ඔබගේ ගායනා සම්බන්ධයෙන් එල්ලවෙන බලවත් චෝදනාවක් තමයි අනුවේදනීය කතා සික්ස් එයිට් එකට කියලා අසන්නා නටවනවා කියන එක. විශේෂයෙන්ම ප්‍රේමවතී මනම්පේරි තරුණිය, කන්දේ හැපුන මහ වනන්තරේ වැනි ගීත ශෝකාන්ත පාදක කරගෙන ලියැවුණත් මේවා ගයන්නේ බයිලා රිදම් එකේ. ඒ ගැන මොකද කියන්නේ ?**

ඒක මගේ ගායනා විලාශයත් එක්ක ඇතිවෙන දෙයක්. මගේ ගායනා විලාශය එක්ක පදමාලාවේ තියන කාරණය ගැන විතරක් හිතලා බීට් එකක් දාන්න අපහසුවක් තියනවා. පදමාලාවේ තේමාව ගැන හිතලා කියලා මට අමරදේව වගේ සින්දු කියන්න බෑනේ. මගේ ගායනා විලාශයට ගැලපෙන්නේ සික්ස් එයිට් එක. සික්ස් එයිට් එකේ සින්දුව කිව්වා කියලා අසන්නාට නටන්න කියලා අපි කියන්නේ නෑනේ. මම නට නට කියන්නෙත් නෑනේ. ඉතිං යම් කෙනෙක් නැටුවයි කියලා මට කරන්න දෙයකුත් නෑ. හැබැයි මේ සින්දු නටන්නේන් නැතුව අහගන ඉන්න විශාල පිරිසකුත් ඉන්නවා.

**වේග රිද්ම ගී හරියටම කියන්න නම් ටිකක් දාගන්න ඕනේ කියලා කතාවක් තියනවා. ඔබේ අත්දැකීම් එක්ක මේ කියමනේ ඇත්තක් තියනවාද?**

ඇත්තක් තියනවා. නිකන්ම කියනවා වගේ නෙවෙයි. ටිකක් දාගත්තම පොඩි ගැම්මක් එනවා සින්දුව කියන්ඩ.

**ප්‍රසංගවලට ගියාම ඔබත් ඒ ක්‍රමේ අනුගමනය කරනවද ?**

ප්‍රසංගවලට ගියාම කොහොමත් බොන්ඩ හම්බවෙනවා. මමත් ටිකක් බොනවා. හැබැයි ගානට. උගුරට එනකම් ගහන්නේ නෑ. අපේ හැමෝම වගේ බොනවා. සමහරුන්ට සීමාවක් නෑ. මිල්ටන් පෙරේරා ජෝතිපාල ඒ කාලේ හොඳටම බොන අය. වික්ටත් එහෙමයි. උදේ නැගිටින්නේ බෝතලේ අතට අරගන. දැන්නම් බොන එක නවත්තලා. මිල්ටන් මල්ලවාරච්චිත් හොඳට බිව්වා. මේ අය අකාලේ මැරෙන්න හේතු වුනෙත් ඔය බීම තමයි.

**ජීවිතේ දිහා ආපහු හැරිලා බලනකොට ගායකයෙක්වීම ගැන මොකද හිතෙන්නේ ?**

සතුටුයි. අන්න ඔයාගේ සින්දුවක් ටීවී එකේ ගියා හරි රේඩියෝ එකේ ගියා හරි කියලා කවුරුහරි කියනකොට එදා වගේම අදටත් ලොකු සතුටක් දැනෙනවා. අනෙක් පැත්තෙන් මේ ඉඩං අරගෙන ගෙවල් දොරවල් හදාගෙන වාහන තියාගන ඉන්න පුලුවන්කම මට ලැබුනෙත් සින්දු කියලා හොයපු සල්ලිවලින් තමයි.

**හුග දෙනෙකුට කලාවයි රස්සාවයි දෙකක් එකට කරගෙන යද්දී මතුවෙන ගැටළු ඔබට මතුවුණේ නැත්ද ?**

මට ඒතරම්ම බලපෑවේ නෑ. ෂෝවලට යන්න ඕනේ උනාම මට බැංකුවෙන් නිවාඩු ලැබුණා. හැබැයි මට උසස්වීම් ගන්න බැරිවුණා. වගකීම් වැඩිවෙන නිසා මම උසස්වීම් ඉල්ලුවේ නෑ. ඒ නිසා විශ්‍රාම යනකන්ම මම ලඝු ලේඛකයෙක් විදිහට තමයි බැංකුවේ රැකියාව කළේ.

**ඔබේ පවුලේ තොරතුරු ගැන ටිකක් කතා කරමුද ?**

මගේ තාත්තා පර්සි ජෝන්ස්. අම්මගේ නම ජේන් ජෝන්ස්. පවුලේ එකම දරුවා මම. මට කලින් හරි පස්සේ හරි තවත් පිරිමි දරුවන් තුන්දෙනෙක් අම්මට ලැබිලා තියනවා. ඒ අය පුංචි කාලෙදිම මැරිලා. මොනව වෙලාද කියන්න මට හරි වැටහීමක් නෑ. මගේ බිරිය අයිරිෂ්. පුතාලා දෙන්නයි දුවලා දෙන්නයි අපිට ඉන්නේ. ලොකු පුතා ටිරෝන් දෙවනියා රෝෂන් දෙන්නම විවාහවෙලා දැන් ප්‍රංශයේ පදිංචිවෙලා ඉන්නේ. තුන්වෙනියා රෝෂිණී දුව ලංකා බැංකුවේ වැඩකරන්නේ. බාලයා ප්‍රියංකා. ඒ දෙන්නත් විවාහ වෙලා වෙනම පදිංචිවෙලා ඉන්නේ.




